# පඤ්චමො පාඨො

# පුඤ්ඤකරණස්ස සහායො

අථ අපරභාගෙ එකො අස්සවාණිජකො අස්සවණිජ්ජාය පුබ්බන්තාපරන්තං ගච්ඡන්තො ආගම්ම ඉමිස්සා ගෙහෙ නිවාසං ගණ්හි. අථ සො වාණිජො තං දිස්වා ධීතුසිනෙහං පතිට්ඨාපෙත්වා ගන්ධමාලවත්ථාලංකාරාදීහි තස්සා උපකාරකො හුත්වා ගමනකාලෙ අම්ම, එතෙසු අස්සෙසු තව රුච්චනකං අස්සං ගණ්හාහීති ආහ. සා'පි අස්සෙ විලොකෙත්වා එකං සින්ධවපොතකං දිස්වා එතං මෙ දෙහීති ආහ. වාණිජො අම්ම, එසො සින්ධවපොතකො අප්පමත්තා හුත්වා පටිජග්ගාහී'ති වත්වා තං පටිපාදෙත්වා අගමාසි. සා'පි තං පටිජග්ගමානා ආකාසගාමීභාවං ඤත්වා සම්මා පටිජග්ගන්තී එවං චින්තෙසි. ''පුඤ්ඤකරණස්ස මෙ සහායො ලද්ධො''ති. අගතපුබ්බා ච මෙ භගවතො සමාරං මාරබලං විධමෙත්වා බුද්ධභූතස්ස ජයමහාබොධිභූමි. යන්නූනාහං තත්ථ ගන්ත්වා භගවතො ජයමහාබොධිං වන්දෙය්‍යන්ති චින්තෙත්වා බහුරජතසුවණ්ණමාලාදයො කාරාපෙත්වා එකදිවසං අස්සමභිරුය්හ ආකාසෙන ගන්ත්වා බොධිමාලකෙ ඨත්වා ආගච්ඡන්තු අය්‍යා සුවණ්ණමාලා පූජෙතුන්ති උග්ඝොසෙසි.

(රසවාහිනී)

**පදමාලාව**

| | | | |
|---|---|---|---|
| **අපරභාගෙ** | (ස) | - | පසුකලෙක |
| **අස්සවාණිජකො** | (ස) | - | අශ්ව වෙළෙන්දෙක් |
| **අස්සවණිජ්ජාය** | (ස) | - | අශ්ව වෙළඳාම පිණිස |
| **පුබ්බන්තාපරන්තං** | (ස) | - | පෙර අපර |
| **ගච්ඡන්තො** | (කි) | - | යන්නේ |
| **ආගම්ම** | (පූ.ක්‍රි) | - | පැමිණ |
| **ධීතුසිනෙහං** | (ස) | - | දුවට සෙනෙහස |
| **පතිට්ඨාපෙත්වා** | (පූ.ක්‍රි) | - | පිහිටුවා |
| **වත්ථාලංකාරාදීහි** | (ස) | - | වස්ත්‍ර අලංකාර ආදියෙන් |
| **ගමනකාලෙ** | (ස) | - | යන කල්හි |
| **අම්ම** | (නි) | - | දරුව |
| **රුච්චනකං** | (කි) | - | රුචි |
| **විලොකෙත්වා** | (පූ.ක්‍රි) | - | බලා |
| **සින්ධවපොතකං** | (ස) | - | සෛන්ධව පැටවෙකු |
| **අප්පමත්තා** | (කි) | - | නොපමාව |
| **පටිජග්ගාහි** | (ක්‍රි) | - | පෝෂණය කරව |
| **පටිපාදෙත්වා** | (පූ.ක්‍රි) | - | සකසා දී |
| **ආකාසගාමීභාවං** | (ස) | - | අහසින් යන බව |
| **සමාරං** | (ස) | - | මරුන් සහිත |

| | | | |
|---|---|---|---|
| මාරබලං | (ස) | - | මාර බලය |
| විධමෙත්වා | (පූ.ක්‍රි) | - | නසා |
| රජතසුවණ්ණමාලාදයො | (ස) | - | රන්රිදී මල් මාලා ආදිය |
| අස්සමහිරුළ්හා | (සං) | - | අසුපිට නැගී |

**අභ්‍යාස**

(1) 'පුඤ්ඤකරණස්ස සභායො' යන ඡේදය සිංහලට නගන්න.
(2) පාලි භාෂාවෙන් පිළිතුරු සපයන්න.

i. කො ඉමිස්සා ගෙහෙ නිවාසං ගණ්හි ?
ii. අස්සවාණිජො තස්සා කිං අදාසි ?
iii. සා සින්ධවපොතකස්ස කීදිසං විසෙසං අඤ්ඤාසි ?
iv. සා කථං බොධිමාලකං අගමාසි ?

(3) ඡේදය ඇසුරින් සිංහලෙන් පිළිතුරු සපයන්න.

i. නිවැසි කාන්තාවට වෙළෙන්දාගෙන් ලැබුණු දේ මොනවා ද?
ii. ''ජයමහාබොධිභූමිං'' ලෙස එම ස්ථානය හැඳින්වීමට හේතුව ලියන්න.
iii. ආර්යයන් වහන්සේලාට බෝධිමලුවට වඩින්නැයි අයැද සිටියේ කුමක් සඳහා ද?
iv. 'අරියසාවක' යන්නට අයත් ආර්ය පුද්ගලයෝ කවරහු ද?

## ආඛ්‍යාත II

### පඤ්චමී ආඛ්‍යාතය

**'පඤ්චමී තු අන්තු හි ථ මි ම, තං අන්තං ස්සු වෙහො එ ආමසෙ ඉති පඤ්චමී සඤ්ඤා'** යනුවෙන් බාලාවතාරයේ **තු** ආදී ප්‍රත්‍යය පඤ්චමියේ යෙදෙන බව දක්වෙයි. පඤ්චමී, ආඛ්‍යාතය **අණකිරීම, ආශීර්වාද කිරීම** යන ප්‍රධාන අර්ථ දෙකක යෙදේ. **(ආණත්‍යාසිට්ඨෙනුත්තකාලෙ පඤ්චමී)** පඤ්චමී ප්‍රත්‍යයමාලාව එක්වී ක්‍රියාපද සැදෙන අයුරු මෙසේ ය.

**කත්තුකාරක පරස්සපද - වරනැගීම**

| පුරිස | ධාතුව | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| පඨම පුරිස | වන්ද | තු | වන්දතු | අන්තු | වන්දන්තු |
| මජ්ඣිම පුරිස | වන්ද | හි | වන්දාහි | ථ | වන්දථ |
| උත්තම පුරිස | වන්ද | මි | වන්දාමි | ම | වන්දාම |


නොමිලේ බෙදා හැරීම පිණිසයි

**කත්තරි අත්තනොපද - වරනැගීම**

| පුරිස | ධාතුව | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|---|
| | | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | වන්‍ද | තං | වන්‍දතං | අන්තං | වන්‍දන්තං |
| **මජ්ඣිම පුරිස** | | ස්සු | වන්‍දස්සු | වෙහො | වන්‍දවෙහො |
| **උත්තම පුරිස** | | එ | වන්‍දෙ | ආමසෙ | වන්‍දාමසෙ |

පඤ්චමී ආඛ්‍යාත පද වාක්‍යවල යෙදෙනවිට අර්ථ දක්වන්නේ මෙසේ ය.

**භුඤ්ජතු භවං ගොතමො.** - පින්වත් ගෞතමයන් වහන්සේ වළඳන සේක්වා.
**රක්ඛන්තු සබ්බදෙවතා.** - සියලු දෙවියෝ රකිත්වා.
**එහි සාරථි නගරං ගච්ඡාහි.** - රියදුරාණනි, එන්න නගරයට යන්න.
**නික්ඛම සමණ පවිස සමණ.** - ශ්‍රමණය නික්මෙන්න, ශ්‍රමණය පිවිසෙන්න.
**ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධසාසනෙ.** - අරඹව් නික්මෙව් බුදු සසුනෙහි යෙදෙව්.
**අහං සුඛී භවාමි.** - මම සැප ඇත්තෙක් වෙම්වා.
**මයං සුඛී භවාම.** - අපි සැප ඇත්තෝ වෙමුවා.

**සත්තමී ආඛ්‍යාත**

**සත්තමී එය්‍ය, එය්‍යුං, එය්‍යාසි, එය්‍යාථ , එය්‍යාමි, එය්‍යාම, එථ එරං එථො එය්‍යවෙහො එය්‍යං එය්‍යාමෙහ එය්‍යාදීනං සත්තමී සඤ්ඤා** (බාලාවතාරය) යනුවෙන් සත්තමී ආඛ්‍යාත ප්‍රත්‍යය මාලාව දක්වෙයි.

සත්තමී ආඛ්‍යාතයෙන් පැවසෙන්නේ හොඳයි, යහපතැයි කරන්න, යනුවෙන් අනුදැනීම යි. වේදෝ හෝ නොවේදෝ හෝ යන තීරණයක් නොමැති අවස්ථා ද පැවසෙයි. **(අනුමති පරිකප්පත්ථෙසු සත්තමී)** කිං, සචෙ, යදි, සෙය්‍යථාපි වැනි නිපාත පද සත්තමී ආඛ්‍යාත පද යෙදෙන වාක්‍යයන් සමඟ යෙදේ. සත්තමී ක්‍රියාපද සහිත වැකි මෙසේ දක්වේ.

- **යන්නූනාහං සයමෙව එකං කුමරිකං ආනෙය්‍යං.**
  යම්හෙයකින් මම ම එක් කුමාරිකාවක ගෙනෙන්නේ නම් මැනවි.
- **යදි පන මෙ පරාජයො භවෙය්‍ය මතං සෙය්‍යො.**
  ඉදින් මාගේ පරාජය වන්නේ නම් මරණය ශ්‍රේෂ්ඨ ය.
- **සචෙ සො පචෙය්‍ය මයං භුඤ්ජෙය්‍යාම.**
  ඉදින් හේ පිසන්නේ නම් අපි අනුභව කරන්නෙමු.
- **සචෙ ත්වං රොදෙය්‍යාසි නාහං කථෙය්‍යාමි.**
  ඉදින් ඔබ අඬන්නේ නම් මම නො කියන්නෙමි.

කත්තරි පරස්සපද - වරනැගීම

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| පඨම පුරිස | එය්‍ය | පචෙය්‍ය<br>පිසන්නේ නම් | එය්‍යුං | පචෙය්‍යුං<br>පිසන්නෝ නම් |
| මජ්ඣිම පුරිස | එය්‍යාසි | පචෙය්‍යාසි<br>පිසන්නෙහි නම් | එය්‍යාථ | පචෙය්‍යාථ<br>පිසන්නෙහු නම් |
| උත්තම පුරිස | එය්‍යාමි | පචෙය්‍යාමි<br>පිසන්නෙම් නම් | එය්‍යාම | පචෙය්‍යාම<br>පිසන්නෙමු නම් |

කත්තරි අත්තනොපද - වරනැගීම

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| පඨම පුරිස | එථ | පචෙථ<br>පිසෙන්නේ නම් | එරං | පචෙරං<br>පිසෙන්නෝ නම් |
| මජ්ඣිම පුරිස | එථො | පචෙථො<br>පිසන්නෙහි නම් | එය්‍යාවෙහා | පචෙය්‍යාවෙහා<br>පිසන්නෙහු නම් |
| උත්තම පුරිස | එය්‍යං | පචෙය්‍යං<br>පිසන්නෙම් නම් | එය්‍යාමෙහ | පචෙය්‍යාමෙහ<br>පිසන්නෙමු නම් |

**හීයත්තනී ආඛ්‍යාතය**

අතීත කාල ක්‍රියා සිද්ධියක් පැවසෙයි. ''**හීයොප්පභුති අතිතකාලෙ හීයත්තනී හොති**'' ඊයේ පටන් ප්‍රත්‍යක්ෂ අතීතකාලය පැවසීමේ දී හීයත්තනී ආඛ්‍යාතය යෙදේ. එහි ප්‍රත්‍යය මාලාව මෙසේ ය.

**හීයත්තනී ''ආ ඌ ඔ ත්ථ අ ම්හා, ත්ථ ත්ථුං සෙ ව්හං ඉං මහසේ'ති ආ ආදීනං හීයත්තනී සඤ්ඤා''** (බාලාවතාර) ඒ අනුව ක්‍රියා වරනැගෙන්නේ පහත පරිද්දෙනි.

කත්තරි පරස්සපද - වරනැගීම

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| පඨම පුරිස | ආ | අපචා (පිසී) | ඌ | අපචූ (පිසූ) |
| මජ්ඣිම පුරිස | ඔ | අපචො (පිසුවෙහි) | ත්ථ | අපචත්ථ (පිසුවෙහු) |
| උත්තම පුරිස | අ | අපච (පිසීමි) | ම්හා | අපචම්හා (පිසූමු) |

### කත්තරි අත්තනොපද - වරනැගීම

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | ත්ථ | අපචත්ථ (පිසී) | ත්ථුං | අපචත්ථුං (පිසූ) |
| **මජ්ඣිම පුරිස** | සෙ | අපචසෙ (පිසුවෙහි) | ව්හං | අපචව්හං (පිසීවෙහු) |
| **උත්තම පුරිස** | ඉං | අපචිං (පිසීම්) | මහසෙ | අපචමහසෙ (පිසූමු) |

**පරොක්ඛා ආඛ්‍යාතය**

"අක්ඛ" **(පච්ච+අක්ඛ)** යනු ඉන්ද්‍රියයන්ට කියන නමකි. ඉන්ද්‍රියන් ඇසුරු කළේ "**පච්චක්ඛ**" නම් වේ. ඉන්ද්‍රියන් ඇසුරු නොකළේ "**අපච්චක්ඛ**" නම් වේ. තමන් නුදුටු ස්ථිර ලෙස නොදත් දේ කීමට **පරොක්ඛා** ආඛ්‍යාතය යොදයි. ("**අපච්චක්ඛෙ පරොක්ඛාතීතෙ**"). "**පරොක්ඛා අ උ එ ත්ථ අ මහ, ත්ථ රෙ වෙහා ඉ මෙහ' ති අ ඉත්‍යාදීනං පරොක්ඛා සඤ්ඤා**" යනුවෙන් බාලාවතාරයේ ප්‍රත්‍යය මාලාව දැක්වේ. ඒ අනුව ක්‍රියා වරනැගෙන්නේ පහත පරිද්දෙනි.

### කත්තරි පරස්සපද - වරනැගීම

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | අ | පපච (පිසුවේලු) | උ | පපචු (පිසුවාහුලු) |
| **මජ්ඣිම පුරිස** | එ | පපචෙ (පිසුවෙහිලු) | ව්හං | අපචව්හං (පිසුවෙහුලු) |
| **උත්තම පුරිස** | අ | පපච (පිසුවෙමමිලු | මහ | පිපච්මහ (පසුවෙමිලු) |

### කත්තරි අත්තනොපද - වරනැගීම

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | ත්ථ | පපචිත්ථ (පිසුවෙවේලු | රෙ | පපචිරෙ (පිසුවාහුලු) |
| **මජ්ඣිම පුරිස** | ත්ථො | පපචිත්ථො (පිසුවෙහිලු) | වෙහා | පපචිවෙහා (පිසුවෙහිලු) |
| **උත්තම පුරිස** | ඉ | පපචි (පිසුවෙමිලු) | මෙහ | පපචිමෙහ (පිසුවෙමුලු) |

**කාලාතිපත්ති ආඛ්‍යාතය**

කිසියම් හේතුවකින් ක්‍රියාව වැළකීගිය අතීත කාලයක් වේ නම් එය කාලාතිපත්ති නම් වේ. '**ක්‍රියාතිපනෙන'තීතෙ කාලාතිපත්ති**'. විරුද්ධ සාධක නිසා බාධා පමුණුවන හේතු නිසා ක්‍රියා සිද්ධිය අභාවයට යාම මෙහි ලක්ෂණය යි. බාලාවතාරයේ **ස්සා ස්සංසු ස්ස ස්සථ ස්සං ස්සම්හා, ස්සථ ස්සිංසු ස්සවෙහ ස්සාමහසෙ'ති ස්සාදීනං කාලාතිපත්ති සඤ්ඤා** යනුවෙන් ප්‍රත්‍යය මාලාව දක්වේ. කාලාතිපත්ති ආඛ්‍යාත පද සෑදෙන්නේ පහත පරිද්දෙනි.

**කත්තරි පරස්සපද - වරනැගීම**

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | ස්සා | අපචිස්සා (පිසුවේ නම්) | ස්සුං | අපචිස්සංසු (පිසුවෝ නම්) |
| **මජ්ඣිම පුරිස** | සෙස | අපචිසෙස (පිසුවෙහි නම්) | ස්සථ | අපචිස්සථ (පිසුවෙහු නම්) |
| **උත්තම පුරිස** | ස්සං | අපචිස්සං (පිසුවෙම් නම්) | ස්සම්හා | අපචිස්සම්හා (පිසුවෙමු නම්) |

**කත්තරි පරස්සපද - වරනැගීම**

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යය | ක්‍රියා පදය | ප්‍රත්‍යය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | ස්සථ | අපචිස්සථ (පිසුවේ නම්) | ස්සිසුං | අපචිස්සිංසු (පිසුවෝ නම්) |
| **මජ්ඣිම පුරිස** | ස්සසෙ | අපචිස්සසෙ (පිසුවෙහි නම්) | ස්සවෙහ | අපචිස්සවෙහ (පිසුවෙහු නම්) |
| **උත්තම පුරිස** | ස්සං | අපචිස්සං (පිසුවෙම් නම්) | ස්සාමහසෙ | අපචිස්සාමහසෙ (පිසුවෙමු නම්) |

**අභ්‍යාස**

(1) පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. අනුරාධපුරෙ මහාචෙතියානි සන්ති.
ii. බුද්ධො ලංකාභූමියං තික්ඛත්තුං පාපුණි.
iii. තුම්හෙ පතිදිනං මාතාපිතුනනං උපට්ඨහථ.
iv. සො විහාරං ගන්ත්වා බුද්ධං වන්දිත්වා පුන ගෙහං ගච්ඡති
v. පුඤ්ඤවන්තො කුමාරො පුඤ්ඤං කරිස්සති.


නොමිලේ බෙදා හැරීම පිණිසයි

(2) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. සියලු පව් නො කරන්න, කුසල් වඩන්න, සිත දමනය කරගන්න, යන මෙය බුදුරදුන්ගේ අනුශාසනාව යි.
ii. පමාවීම මරණයට හේතුවයි. නොපමාව නිවණට හේතු වෙයි.
iii. බුදුරජාණන් වහන්සේ මුල මැද අග යහපත් වූ ධර්මය දෙසූ සේක.
iv. සෝක නො කරන්න. නො වැළපෙන්න. ඒ මහා ශ්‍රමණයාගෙන් මිදුණේ වෙමු.
v. සියලු සත්වයෝ සතුටු සිතැත්තෝ වෙත්වා.

(3) පහත වචන යොදා වාක්‍ය සකස් කරන්න.

| | | | |
|---|---|---|---|
| i. | ගවෙෂයාය | vi. | දදිස්සති |
| ii. | පපව්ජා | vii. | භවෙයයාම |
| iii. | පපච | viii. | අකාසි |
| iv. | ලිඛමහා | ix. | සුණාතු |
| v. | ධාවිස්සං | x. | අදදිං |

(4) භූ, ලිඛ, සු, ධා, කර, යන ධාතු අජ්ජතනී, පරොක්ඛා, භවිස්සන්ති යන ආඛ්‍යාතවල පරස්සපදයෙහි වරනගන්න.